# බළන්ගොඩ නගර සභාව

## 2019-05-14 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2019.05.14**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමළසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමළසේන |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්. එච්. ඒ. කරුණාරත්න මිය

**01. පසුගිය සභාවේ සභා වාර්තාව හා සම්මත කිරීම.**

2019-05-14 වන දින මාසික මහසභාවේ වැඩකටයුතු ආරම්භ කල ගරු සභාපතිතුමන් විසින්, 2019.05.14 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා විසින් 2019.04.09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමළසිරි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.
මෙහිදී අදහස් පලකල ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන් විසින් සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා එක් මන්ත්‍රිවරයෙක් විසින් පමණක් ස්ථිර කිරීම වැරදි සහගත බවත් ඒ සඳහා අනෙක් මන්ත්‍රිවරුන්ට ද ඉඩකඩ ලබාදිය යුතු බවත් පවසා සිටින ලදී.

මෙදින සභා වාර්තාව සඳහා සංශෝධන තිබේදැයි ගරු සභාපතිතුමන් විසින් විමසා සිටි අවස්ථාවේ අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් 2019.04.09 දිනැති මහ සභාවේ තමන් විසින් වෙනත් කරුණු යටතේ රාස්සගල මාර්ගය කාපට් දමා සංවර්ධනය කිරීම සම්බන්ධව පල කරන ලද අදහස් අනුව, එම සංවර්ධන කටයුතු නියමිත ප්‍රමිතියෙන් තොර බවට මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර ලිපියක් යවන මෙන් තමන් කරන ලද ඉල්ලීම සභාපතිතුමන් විසින් පැහැර හැර ඇති බවට කරන ලද ප්‍රකාශය සංශෝධනයන්හි අඩංගු විය යුතු බවට පවසා සිටින ලදී.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ගරු සභාපතිතුමන් විසින් නිවේදන ආරම්භ කරමින් , අසනීප තත්වය හේතුවෙන් අද දින සභාවට පැමිණිය නොහැකි බවට දන්වා ඇති ගරු නාගරික මන්ත්‍රි අකිළ එල්ලාවල මැතිතුමන්ට හා ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමන්ට නිවාඩු අනුමත කරන බව පවසා සිටින ලදී.

- **පුබුදමු ගම්මැද්ද වැඩසටහන පිළිබඳව සභාව දැනුවත් කිරීම**

**මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමන් විසින්** 2019.05.07 දින සවස 3.00 ට බලංගොඩ නගර සභා බල ප්‍රදේශයේ කොට්ඨාශ 10 ට අදාළ ග්‍රාම නිළධාරීන් ,ආර්ථික සංවර්ධන නිළධාරින්,හා සමෘද්ධි සංවර්ධන

නිළධාරින් කැඳවා මූලික වටයේ සාකච්ඡාවක් පවත්වන ලද බවත් එහිදී එක් එක් කොට්ඨාශ තුළ සිටින ප්‍රජා නායකයින් කැඳවා ඔවුන් මේ සම්බන්ධව දැනුවත් කිරීමටත්, ඔවුන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීමටත් තීරණය වූ බව පවසා සිටින ලදී.ඒ අනුව ඒ ඒ කොට්ඨාශය තුළ වෙන් කර ගත් දිනයන්හිදී අදාළ කොට්ඨාශයේ පොදු ස්ථානයකට කැඳවා දෙවන වටයේ සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු යොදා ගන්නා ලද අතර, කොට්ඨාශයේ මන්ත්‍රිවරුන් හා ප්‍රජා නායකයින් සම්බන්ධ කරගනිමින් දෛනික ජීවිතය තුළ හඳුනාගන්නා ලද ගැටළු සඳහා සාර්ථක විසඳුම් ලබාගැනීමට මින් හැකියාව ලැබෙන බව පවසා සිටින ලදී.

කොට්ඨාශය හා දිනයන් පිලිබඳව ගරු සභාපතිතුමන් විසින් සභාව දැනුවත් කරන ලදී.

බුළත්ගම / තුඹගොඩ - මැයි 13 ප.ව. 3.00 ප්‍රජා ශාලාවේදී

බළන්ගොඩ මැයි 27 ප.ව. 3.00 ප්‍රජා ශාලාව

තලංගම / කුමාරගම මැයි 28 ප.ව. 3.00 කොටබෝධිය පන්සල

බළන්ගොඩ නගරය ජූනි 01 ප.ව. 3.00 විරසුන්දරාරාමය

කිරිදිගල / ඕළුගංතොට ජූනි 08 ප.ව. 3.00 කිරිදිගල ග්‍රාම නිළධාරි කාර්යාලය

කිරිමැටිතැන්න /දෙහිගස්තලාව කොට්ඨාශ සඳහා රාමසාන් උත්සවයෙන් පසු දින තීරණය කරන බවට වැඩිදුරටත් පවසා සිටින ලදී.

●නගර සභා ක්‍රීඩාංගණයට යාබද ඉඩම නගර සභාව වෙත අත්පත් කර ගැනීම සම්බන්ධව දේශපාලන දෘෂ්ඨි කෝණ අනුව නොසිතා ඉදිරියේදී කුමන ආකාරයෙන් සභාව වෙනස් වුවද ,නගරයේ මතු පරපුරේ සුභ සිද්ධිය උදෙසා එම ඉඩම රැක ගැනීම සභාවේ සියළු සභිකයන්ගේ වගකීම බව ගරු සභාපතිතුමන් විසින් මෙහිදී පවසා සිටින ලදී.

● රටේ පැවති නොසන්සුන්කාරී තත්වය හමුවේ නගරයේ ආරක්ෂාව සුරක්ෂිත කිරීම උදෙසා කැපවී ක්‍රියා කරන ලද සහකාර පොලිස් අධිකාරී,පොලිස් නිළධාරීන්,ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, විශේෂ කාර්යය බලකාය,සිවිල් ආරක්ෂක නිළධාරීන් හා සිවිල් ආරක්ෂක කමිටු වෙත ස්තූතිය පිරිනමන බව ගරු සභාපතිතුමන් විසින් පවසා සිටින ලදී.

● දිගු කාලයක සිට ජලය හිඟකමින් පීඩාවිදි සදුන්ගම ගම්වැසියන් මේ දක්වා නගර සභා ජල බවුසරය මගින් ජලය ලබාගත් ක්‍රමවේදයෙන් මුදවා එම දුෂ්කර ජීවන තත්වය අතහරිමින් ජලය ක්‍රමවත්ව හා පහසු ආකාරයෙන් ලබාගැනීම සඳහා ජලයෝජනා ක්‍රමයක් ලබාදීමට හැකිවීම සම්බන්ධයෙන් නගර

සභා සභාපතිවරයා ලෙස තමන් ඉතාමත් සතුටට පත්වන බව ගරු සභාපතිතුමන් විසින් පවසා සිටින ලදී.

●ඉදිරියේදී එළඹීමට නියමිත වෙසක් උත්සවය සඳහා ජාති ආගම් භේදයෙන් තොරව නගරයේ සියළුම දෙනා එක්ව,එක් වෙළෙඳ සැලකින් අවමය වෙසක් කූඩු 2ක්,බල්බ් වැලක් හා බෞද්ධ කොඩියක් එසවීමට කටයුතු කල යුතු බවට පවසා සිටි ගරු සභාපතිතුමන් විසින්, නගරයේ අවුරුදු උත්සවය සංවිධානය කරන ලද ආදි ශිෂ්‍යය සංගම් එකමුතුව විසින් ඔරලෝසු කණුව අසළ සිට කොමර්ෂල් හන්දිය දක්වා විදුලි ආලෝකයෙන් ආලෝකමත් කිරීමට කටයුතු සංවිධානය කර ඇති බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිමන් විසින් අදහස් දක්වමින් පුබුදමු ගම්මැද්ද වැඩසටහන යටතේ වැවවත්ත කොට්ඨාශය තෝරා ගැනීම හොඳ බව පවසා සිටි අතර,එම ගම්වැසියන් විසින් ඉල්ලා සිටින ලද බොහෝමයක් ඉල්ලීම්,මීට පෙර සභාවන් සඳහා තමන් විසින් ඉදිරිපත් කර යෝජනා සම්මත කරගන්නා ලද ඉල්ලීම් බවත් ඒ සඳහා ප්‍රමුඛත්වය ලබා ද කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් කොට්ඨාශයේ මන්ත්‍රීවරයාගේ යෝජනා සඳහා ප්‍රමුඛත්වය ලබාදී කටයුතු කිරීමට අපේක්ෂා කරන බව පවසා සිටින ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

මෙහිදී අදහස් පල කරන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් ගරු නාගරික මන්ත ලාල් ගලප්පත්ති මැතිතුමන් මගින් කරවිකැටිය,උඩකන්ද මාර්ගයේ ගම්වැසියන් විසින් මෙදින සභාව වෙත යොමු කරන ලද ලිපියක් සභාගත කිරීමට අවශ්‍යය බව පවසා සිටින ලදී.ඒ අනුව කරවිකැටිය,උඩකන්ද මාර්ගයේ කොන්ක්‍රීට් ස්ලැබ් දමා ආවරණය කිරීමේ කර්මාන්තය නිසි ප්‍රමිතියට අනුව සිදු වී නොමැති බවත් මහජන මුදල් වැයකර සිදු කරන ලද මෙම කර්මාන්තය පිලිබඳව සභාවේ අවධානය යොමු කරන ලෙසත් එහි දක්වා තිබුනි.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් තෙබුවන ගරාජය වෙත රු.64,930.00ක් ගෙවීමට ඇති බවට තමා වෙත ලිපියක් ඉදිරිපත් කර ඇති බවත් ඒ පිළිබඳව සභාවේ අවධානය යොමුකරන ලෙසත් පවසා සිටින ලදී. එමෙන්ම තව දුරටත් , ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද උඩකන්ද මාර්ගයේ කොන්ක්‍රීට් ස්ලැබ් දමා ආවරණය

කිරීමේ කර්මාන්තය සම්බන්ධයෙන් අදහස් දක්වමින් මෙසේ සභාවේ මුදල් අයථා ලෙස පරිහරණය කිරීමට ඉඩදිය නොහැකි බවත් මෙහි ප්‍රමිතිය පිලිබඳව අදාල පාර්ශව දැනුවත් විය යුතු බවත්, මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් ගෙවීම සම්බන්ධව තම සම්පූර්ණ විරෝධය දක්වන බවත් පවසා සිටින ලදී. එමෙන්ම වැලිහරනාව මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියද අසාර්ථක බවත් ඒ සම්බන්ධයෙන්ද ගම්වාසීන් විවිධ චෝදනා නගන බවත් වැරදි දේ සඳහා කිසි විටෙක අනුමැතිය ලබා නොදෙන බවත් අසාර්ථක ව්‍යාපෘති සඳහා මුදල් ගෙවීමට විරුද්ධ බවත් පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් රු.500,000.00 දක්වා මුදල් වියදම් කිරීමේ බලය සභාපතිවරයාට ලබාදීමේ යෝජනාවට විරුද්ධත්වය දැක්වූයේ මෙවන් වැරදි සිදුවීම් වීමට ඇති ඉඩකඩ නිසා බව පවසා සිටි අතර, එම වැරදි යෝජනාව සම්මත කර ගත් නිසාවෙන් මෙවන් සිදුවීම් සිදුවන බවත් කිසිදු ප්‍රමිතියකට අනුව සිදු නොකරන ලද මෙම ව්‍යාපෘතිය සම්බන්ධව විරුද්ධත්වය දක්වන බවත් ඒ සඳහා සභාවේ බෙදීමකට යාමට වුවද සූදානම් බවත් පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමන් අදහස් දක්වමින් සමහරක් මන්ත්‍රීවරුන් සතුව කර්මාන්ත කටයුතු සඳහා අවැසි තාක්ෂණික දැනුම නොමැති බවත් අදාළ සමිතියට වගකීම භාරදිය යුතු බවත් පවසා සිටි අතර, තමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද පළමු යෝජනාව වන සඳුන්ගමට ජලය ලබාදීමේ සංවර්ධන කාර්යය සභාව මගින් සිදු කල අවස්ථාවේ තමාවෙත කිසිදු දැනුවත් කිරීමක් සිදු නොකල බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් අදහස් දක්වමින් ,මෙම මාර්ගයේ සංවර්ධනය සඳහා ප්‍රතිපාදන ඉල්ලනු ලැබුයේ පාසල් ළමුන්ට පයින් ගමන් කිරීමට හැකිවන ආකාරයෙන් සකස් කිරිමට බවත්, එමෙන්ම මාර්ගය අසළ නිවැසියන්ගේ ඉදිරිපස බැම් කැඩෙන බැවින් පයින් ගමන් කල හැකි ආකාරයෙන් සංවර්ධනය කල අතර, තවමත් මෙහි වැඩ නිමාකර නොමැති හෙයින් ඉදිරියේදි නිසියාකාරව නිම කිරීමට අපේක්ෂා කරන බවත් පවසා සිටින ලදී.

ගරු සභාපතිතුමන් විසින් මෙහිදී අදහස් දක්වමින්,මෙය ගැටළුවක් කරගනිමින් ප්‍රශ්න ඇති කර නොගෙන ඉදිරියේදි සියළුදෙනා එක්ව ක්‍රමවත්ව වැඩ කටයුතු සිදු කිරිම සුදුසු බව පවසා සිටින ලදී.

## 04. කල් දී ඇති ප්‍රශ්න

### *04ඃ01 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා*

04ඃ01ඃ01 සම්මත අතුරු ව්‍යවස්ථාව අනුව නගර සභා සීමාව තුළ මස්,මාළු,එළවළු,පළතුරු,කුකුළු මස්

විවෘත ගබඩා තුළ විකිණීම නවතාලීමට ගත් පියවර සභාවට දැනුම් දීම?

මෙම ගැටළුවට පිළිතුරු ලබාදෙමින් ගරු සභාපතිතුමන් විසින්,මෙම ගැටළුව සඳහා 2018.12.13 දිනැති සභාවේද තමන් විසින් පිළිතුරු ලබාදී ඇති බවත්, පනතින් ලැබී ඇති බලතල අනුව සභාපතිවරයාගේ අනුමැතිය පරිදි මෙය සිදු කල හැකි අතරම මෙය ඉතා කාලාන්තරයක සිට සිදුවෙමින් ආ ක්‍රමවේදයක් වන අතර,පොදු වෙළෙඳ සැලද ක්‍රමවත් තත්වයක නොමැති තත්වය මත මහජන නියෝජිතයන් වශයෙන් මිනිස් අවශ්‍යතා සපුරාලීම වගකීමක් වන බැවින් මෙම තත්වය පවත්වාගෙන යාමට සිදුවන බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් අදහස් දක්වමින් පසුගිය කාල වකවානුවේ යම් ස්ථාන දෙක තුනක විවෘත ගබඩා තුළ මාංශ අලෙවිය සඳහා ඉඩ ලබාදුන් බවත් පිටින් මස් ප්‍රවාහනය කරන විට ගොවිපළේ මැරූන සතුන් පවා අලෙවිය සඳහා ඉදිරිපත් කරන බැවින් හා අධි ශීතකරණවල ගබඩා කරන ලද මාංශවල කල් ඉකුත් වීමේ දිනය අඩංගු වන බවත් පවසා සිටින ලදී.වර්තමානයේ නගරය පුරා අළුතින් මාංශ වෙළෙද සැල් ආරම්භ කර ඇති බවත් මහජන පොළ ප්‍රවේශයේ බුදු මැදුර ඉදිරිපිට මෙන්ම දෙහිගස්තලාව මාර්ගයේ අළුතින් මාංශ වෙළෙද සැල් බොහොමයක් දක්නට ඇති බවත් මෙම තත්වය නතර විය යුතු බවත් පවසා සිටින ලදී. එමෙන්ම නගර සභා සීමාව වෙළෙඳ පොල සීමාව දක්වා දීර්ඝ කිරීමට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් මෙහිදී යෝජනා කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් අදහස් දක්වමින් කුකුල් මස් කඩ වැඩි වශයෙන් පවත්වාගෙන යනු ලබන්නේ මුස්ලිම් ජනතාව බැවින් එසේ සිදු කිරීම මුස්ලිම් ජනතාවට සිදු කරන ද්‍රෝහිකමක් බවත්, නගර සභා සීමාව දීර්ඝ කිරීමට තම විරෝධය දක්වන බවත් පවසා සිටින ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා සභාවේ හිටපු සභාපතිවරයෙක් වශයෙන් සභාවක් පවත්වාගෙන යාමට මුදල් අවශ්‍ය බව හොදින්ම දන්නා කරුණක් බැවින් සභාව ආදායම් රැස්කර ගැනීමට ඇති ක්‍රමවේද නතර කිරිම සුදුසු නොවන බවත්, පොදු වෙළෙද සැල සකස් කර ගන්නා තෙක් හා සභාව මගින් විශාල ණය මුදල් ප්‍රමාණයක් ගෙවීමට ඇති බැවින් අළුත් ආදායම් උත්පාදන ව්‍යාපෘතිවල අවශ්‍යතාවය ඇති බව පවසා සිටින ලදී.එමෙන්ම වෙළෙඳ පොළ සීමාව දීර්ඝ කිරීම සිදු කල නොහැකි බවද මෙහිදී පවසා සිටින ලදී.

**04ඃ01ඃ02 නගර සභාවේ වාහන අළුත් වැඩියා කිරීමෙන් පසු කඩිනමින් මුදල් ගෙවනවාද?**

ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන් විසින් නගර සභාවේ වාහන අළුත් වැඩියා කිරීමෙන් පසු කඩිනමින් මුදල් ගෙවනවාද යන ගැටළුවට පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින් එසේ මුදල් ගෙවන බවත්, මෑත කාලීන බිල් කීපයක් හැරෙන්නට එසේ ප්‍රමාද වූ බිල් නොමැති බවත් අවශ්‍ය නම් ඒ සම්බන්ධ වාර්තාවක් ලබාදිය හැකි බවත් පවසා සිටින ලදී.

**05. කල් දී ඇති යෝජනා**

***05ඃ01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා***

**05ඃ01ඃ01 ලීටර් 4000 නවගලි බවුසරය සඳහා මිල ගණන් තීරණය කිරීම.**

ලීටර් 4000 නවගලි බවුසරය සඳහා මිල ගණන් තීරණය කිරීමේ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

**එහිදී ලීටර් 4000 ගලි බවුසරය සඳහා ඉදිරිපත් කරන ලද මිල ගණන් මෙසේය.**

| නගර සිමාව තුළ / පිටත | ලෝඩ් 1ක් ඉවත් කිරිම | ප්‍රවාහන ගාස්තු | අවසාන බැහැරලිම | වැට් | ජා.ගො.බ. | එකතුව |
|---|---|---|---|---|---|---|
| 01. නගර සිමාවේ නිවාස/ආගමික ස්ථාන/පූජ්‍ය ස්ථාන/පාසැල සදහා /රජයේ ස්ථාන | 3000.00 | 1750.00 | 1500.00 | 956.63 | 127.55 | 7334.18 |
| 02. නගර සිමාවේ ව්‍යාපාරික සදහා | 4000.00 | 1750.00 | 1500.00 | 1109.69 | 147.95 | 8507.64 |
| 03. නගර සිමාවෙන් පිටත නිවාස/ආගමික ස්ථාන /පූජ්‍ය ස්ථාන/පාසැල් සදහා /රජයේ ස්ථාන | 5500.00 | 3000.00 | 1500.00 | 1530.61 | 204.08 | 11734.69 |
| 04.නගර සිමාවේන් පිටත ව්‍යාපාරික සදහා | 6000.00 | 3000.00 | 1500.00 | 1607.14 | 214.28 | 12321.42 |

මේ සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ02 පුස්තකාලය සඳහා ලේඛන කලාවේ විකාශනය ප්‍රදර්ශනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම.**

පුස්තකාලය සඳහා ලේඛන කලාවේ විකාශනය ප්‍රදර්ශනය කිරීම සඳහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

මේ සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ03 පුස්තකාලය සඳහා දෙමළ භාෂා අංශයක් ස්ථාපිත කිරීම.**

පුස්තකාලය සඳහා දෙමළ භාෂා අංශයක් ස්ථාපිත කිරීම සඳහා සභා අනුමැතිය ලබාගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

මේ සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ04 පුස්තකාලය සඳහා එළිමහන් අධ්‍යයන අංශයක් ස්ථාපිත කිරීම.**

පුස්තකාලයේ පවතින ඉඩකඩ එය පරිභණය කරන පාඨක පිරිස සඳහා කිසිසේත් ප්‍රමාණවත් නොවන හෙයින් මෙම ගැටළුව යම් තරමකට මඟ හරවා ගැනිම සඳහා අධ්‍යයන අංශයේ කොටසක් පුස්තකාලයේ මිදුලේ සකස් කිරීමට සභා අනුමැතිය පතමින් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

මේ සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:05 වරිපනම් එකතු කිරීමේ ජංගම වැඩසටහන් පැවැත්වීම.**

සභාවේ ප්‍රවර්ථන වර්ෂයේ ආදායම් සහ හිඟ ආදායම් අයකර ගැනීම මෙන්ම වරිපනම් සම්බන්ධයෙන් ජනතාවගේ ගැටළු සාකච්ඡා කිරීමේ අරමුණින් කොට්ඨාශ මට්ටමින් ජංගම වැඩසටහන් කිහිපයක් පැවැත්වීම සඳහා සභා අනුමැතිය පතමින් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

මේ සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:06 කසළ ඉවත් කිරිමේ සැලැස්ම (දිරන හා නොදිරන කසළ) සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

කසළ ඉවත් කිරිමේ සැලැස්ම (දිරන හා නොදිරන කසළ) සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

මේ සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:07 කසළ ඉවත් කිරීමේ ටෙන්ඩර්කරුගේ ටෙන්ඩරයෙන් ඉවත්වූ පසු ඇප මුදල් නැවත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.**

කසළ ඉවත් කිරීමේ ටෙන්ඩර්කරු ටෙන්ඩරයෙන් ඉවත්වූ පසු ඇප මුදල් නැවත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමන් විසින් ,සභාවේ අදහස් පිළිබඳ සලකා බලා හා ටෙන්ඩර් කරු පිළිබඳව සද් භාවයෙන් සිතා බලා ටෙන්ඩරය සඳහා පුවත්පත් දැන්වීමට වැය වූ මුදල අඩුකර ඉතිරි මුදල ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් පවසා සිටින ලදී.

මේ සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:08 රථවාහන නැවතුම් ගාස්තු ටෙන්ඩර්කරු හා පෞද්ගලික බස් ගාල් ගාස්තු ටෙන්ඩර්කරු විසින් සභාවට අයකරන මුදල් සම්බන්ධව සහන ඉල්ලා සිටීම.**

රථවාහන නැවතුම් ගාස්තු ටෙන්ඩර්කරු හා පෞද්ගලික බස් ගාල් ගාස්තු ටෙන්ඩර්කරු විසින් සභාවට අයකරන මුදල් සම්බන්ධව සහන ඉල්ලා සභාවට ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බලා, අප්‍රේල් නිවාඩු දින හා හදිසි ත්‍රස්ත ප්‍රහාරය නිසා රටේ සිදුවූ නොසන්සුන්කාරි තත්වය හමුවේ රථවාහන නතර කර යාම සීමාවූ නිසා රථවාහන නැවතුම් ගාස්තු ටෙන්ඩරයේ ආප්‍රේල් 13 වන දින සිට අප්‍රේල් 24 දක්වා දින 10ක් නිදහස් කිරීමටත් පෞද්ගලික බස් ගාල් ගාස්තු ටෙන්ඩරයේ දින 05ක් නිදහස් කිරීමටත් සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

මේ සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:09 ගලි ප්‍රතිකාරක පද්ධතිය සවිකිරීම සඳහා භූමිය සකස් කිරීම**

ගලි ප්‍රතිකාරක පද්ධතිය සවිකිරීම සඳහා භූමිය සකස් කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර,ගරු නාගරික මන්ත්‍රිනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි. මෙහිදි අදහස් දැක්වූ ගරු සභාපතිතුමන් විසින් දැනට බස් නැවතුම්පොළ වැසිකිලි වලවල් දෛනිකව හිස් කිරීමට සිදු වීම තුළ සභාවට විශාල වියදමක් දැරිමට සිදුවෙන බැවින් බාහිර පාර්ශව වෙත ලබාදෙන සේවාව

වැඩි කිරීමටත්,එමගින් ගලි බවුසරයෙන් උපයන ආදායම වැඩිකර ගැනීමටත් හැකිවන බව ගරු සභාපතිතුමන් විසින් මෙහිදී පවසා සිටින ලදී.

මේ සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:10 පොහොර කවරවල මිල පොහොර මිලට එකතු කර අයකර සිටීම**

පොහොර කවරවල මිල පොහොර මිලට එකතු කර අයකර සිටීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි. එහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමන් විසින් දැනට කොම්පොස්ට් පොහොර කිලෝ 1ක් රු. 8.00 මුදලකට අලෙවි කරන අතර කිලෝ 50 ක පොහොර උරයක් මුද්‍රණය කර ලබාගැනීම සඳහා රු.73.00 මුදලක් වැය වෙන බැවින් පොහොර උරය සඳහා යන වියදම පොහොර මිලට එකතු කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමන් විසින් කිලෝ 50 ක පොහොර උරයක් රු.490.00 කට ලබාදීම සුදුසු බවට කරන ලද යෝජනාව ගරු සභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදුව විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:11 තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු නිළධාරි ලෙස සභාවේ ලේකම් සහ නම්කල නිළධාරියා ලෙස ගරු සභාපතිතුමා පත් කිරීම.**

තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු නිළධාරි ලෙස සභාවේ ලේකම් සහ නම්කල නිළධාරියා ලෙස ගරු සභාපතිතුමා පත් කිරීමේ යෝජනාව

ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.එහිදී සභාවේ දැනට පවත්වාගෙන යන ක්‍රමවේදය යෝග්‍ය බව බහුතර අදහස වූ බැවින් ගරු සභාපතිතුමන් විසින්, තොරතුරු නිළධාරි ලෙස සභාවේ ලේකම් සහ නම්කල නිළධාරියා ලෙස ප්‍රධාන කළමණාකරන සහකාර පත්කිරිම සුදුසු බවට ඉදිරිපත් කල යෝජනාව ගරු නාගරික නාගරික මන්ත්‍රිනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

මේ සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එම යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05፥01፥12 පැරණි නිළ නිවාස ඉවත් කර එම භූමියේ වෙළෙඳ සංකීර්ණයක්,ආයුර්වේදය,විදුනැණ පියස හා නිළ නිවාස ඉදිකිරීම.**

පැරණි නිළ නිවාස ඉවත් කර එම භූමියේ වෙළෙඳ සංකීර්ණයක්,ආයුර්වේදය,විදුනැණ පියස හා නිළ නිවාස ඉදිකිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන් විසින් අදහස් දක්වමින් ආයුර්වේදය සහිත ගොඩනැගිල්ල ඉතාමත් පැරණි ගොඩනැගිල්ලක් වන අතර,එම ගොඩනැගිල්ල බලංගොඩ නගර සභාව , සභාවක් ලෙස පත්කරමින් හිටපු අග්‍රාමාත්‍ය එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක මැතිතුමන් වෙත ප්‍රණාමයක් ලෙස බාන්ස් රත්වත්තේ මැතිතුමන් විසින් ඉදිකරන ලද්දක් බව පවසා සිටි අතර එහි ඇති ඓතිහාසික බාවය නිසා එම කොටස කඩා ඉවත් නොකරන ලෙස පවසා සිටි අතර එම ස්ථානයේ ආයුර්වේද රෝහලක් ඉදිකිරීම සුදුසු බව පවසා සිටින ලදි.

විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05፥01፥13 සමාජ විශේෂඥ නිමල් ප්‍රේමතිලක මහතාගේ සේවය ලබා ගැනීමට අදාළ ගාස්තු සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.**

බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ කොම්පෝස්ට් ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු සඳහා සමාජ විශේෂඥ නිමල් ප්‍රේමතිලක මහතාගේ සේවය ලබාගැනීම සඳහා 2015.04.09 දිනැති සභාවේ අනුමත කරගන්නා ලද අතර සම්පත් දායක දීමනාව වශයෙන් සභාවට පැමිණෙන එක් දිනක් සඳහා රු.12,100.00 මුදලක්

ගෙවීමට සහා අනුමැතිය පතමින් ගරු සභාපතිතුමන් විසින් යෝජනාව ඉදිරිපත් කරන ලදී.එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙම මුදල සඳහා සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**06. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

**06:01 කරවිකැටිය, කොටුගොඩැල්ල මාර්ගයේ පැති බැම්ම සකස් කිරීම රු.270,000.00**

කරවිකැටිය ,කොටුගොඩැල්ල මාර්ගයේ පැති බැම්ම සකස් කිරීමේ රු.270,000.00ක ද්‍රව්‍යය ඇස්තමේන්තුව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.
සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**07. මන්ත්‍රි යෝජනා**

07:01 **ගරු නාගරික මන්ත්‍රි ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා**

**07:01:01 බලංගොඩ අක්කර 18 සමගි මාවතේ ෆොන්සේකා මහතාගේ නිවස අසළ මාර්ගය අඩි 100 කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම**

ගරු නාගරික මන්ත්‍රි ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද බලංගොඩ අක්කර 18 සමගි මාවතේ ෆොන්සේකා මහතාගේ නිවස අසළ මාර්ගය අඩි 100 කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.
මෙහිදී ගරු සභාපතිතුමන් විසින් මේ සඳහා ඇස්තමේන්තුව සකස් කරන ලෙස උපදෙස් ලබා දුන් අතර විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

07:02 **ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය**

07:02:01 බස්නැවතුම්පොළ ගොඩනැගිල්ලේ වහළ සකස් කිරීමෙන් පසුව පාසල් ළමුන් යොදවා බිත්තිවල චිත්‍ර ඇදීම.

07:02:02 කරව්කැටිය ,කොටුගොඩැල්ල නිවසකින් පිටවන අපද්‍රව්‍යය කාණුවට දැමීමෙන් ගම්වාසීන් අපහසුතාවයට පත්වීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීම.

ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් බස්නැවතුම්පොළ ගොඩනැගිල්ලේ වහළ සකස් කිරීමෙන් පසුව පාසල් ළමුන් යොදවා බිත්තිවල චිත්‍ර ඇදීමෙන් එහි අලංකාරය මෙන්ම ආරක්ෂාව සුරක්ෂිත කර ගැනීමට හැකි වෙන බවත් මිනිසුන්ගේ මානසික සෞඛ්‍යය කෙරෙහිද යහපත් අයුරින් බලපාන බවත් පවසා සිටින ලදී. එමෙන්ම, කරව්කැටිය ,කොටුගොඩැල්ල නිවසකින් පිටවන අපද්‍රව්‍යය කාණුවට දැමීමෙන් ගම්වාසීන් අපහසුතාවයට පත්වීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීම කෙරෙහිද සභාවේ කඩිනම් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටි ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් මේ ගැටළුව නිසා මහජනතාව විඳින පීඩාව පිළිබඳව වැඩි දුරටත් කරුණු ඉදිරිපත් කරන ලදී.

මෙහිදී අදහස් පලකරන ලද ගරු නාගරික මන්ත්‍රි ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් බස්නැවතුම්පොළ ගොඩනැගිල්ලේ බිත්තිවල වෙළෙඳ දැන්වීම් ඇදීම සුදුසු බව පවසා සිටින ලදී.

විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

07:03 **ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී. වීරසිංහ මැතිතුමා**

07:03:01 කොළඹ ,බදුල්ල මාරගයේ ඇල්ෆාවත්ත මංසන්ධිය අසෙන්නයේ පදික මාරුවක් ලකුනු කිරීම.

07:03:02 ඕළුගංතොට ,රත්න මෝටර්ස් ඉදිරිපිට බස්නැවතුම්පොල බෝඩ් එකක් සවි කිරීම.

07:03:03 ඇල්ෆාවත්ත ජනපදයට පිවිසුම් මාර්ගය මීටර් 40 ක් දිග මීටර් 6 ක් පළල කොටස පිළිසකර කර ගැනීම.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමන් විසින්, ඇල්ෆාවත්ත ජනපදයට පිවිසුම් මාර්ගය මීටර් 40 ක් දිග මීටර් 6 ක් පළල කොටස පිළිසකර කර ගැනීමේ කර්මාන්තය ජූනි මස නඩත්තු ලේඛනයට ඇතුළත් කරන ලෙස උපදෙස් ලබාදෙන ලදී.

විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**08. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2019.03.27 දින /2019.04.10 පැවති මුදල් හා කර්මාන්ත කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| **පුනරාවර්ථන ලැබීම්** | **8,463,605.47** |
| **වෙනත් ලැබීම්** | **1,627,699.05** |
| **මුලු ලැබීම්** | **10,091,304.52** |
| **පුනරාවර්ථන වියදම්** | **9,583,365.25** |
| **වෙනත් වියදම්** | **3,761,542.41** |
| **මුලු වියදම්** | **13,344,907.66** |

**ඉන්ධන වාර්තාව සභාවට ඉදිරිපත් කිරිම.**

2019 -05-01 සිට 2019-05-31 දක්වා

| **වාහන අංකය** | **මුළු එකතුව** |
|---|---|
| 227-5020 | 25,755.00 |
| 227-5020 | 910.00 |

| | |
|---|---|
| 226-7521 | 18,200.00 |
| 56-1906 | 16,952.00 |
| BC-0005 | 31,200.00 |
| MG 0014 | 10,119.20 |
| GC 0001 | 5,596.00 |
| GK-1483 | 6,656.00 |
| GK-6227 | 27,315.00 |
| GK-6227 | 1,614.00 |
| HF - 8558 | 9,880.00 |
| JD-4684 | 1,518.00 |
| LL-2110 | 14,012.00 |
| LL-7688 | 5,720.00 |
| ND-5124 | 14,809.60 |
| OS-0006 | 2,640.00 |
| PF-4006 | 18,720.00 |
| QL-2901 | 4,224.00 |
| ZA - 1068 | 7,280.00 |
| ZA - 6908 | 7,280.00 |
| ZA - 1990 | 7,280.00 |
| RB-4786 | 35,898.00 |
| RC-1107 | 19,330.00 |
| RC-1107 | 1,590.00 |
| RC-1118 | 37,476.00 |
| RC-8183 | 37,520.00 |
| RD-8240 | 24,800.00 |
| UQ - 1933 | 5,280.00 |
| SDRR 0013 | 5,200.00 |
| ZA - 9835 | 12,480.00 |
| YG-0758 | 1,980.00 |
| ZA - 5039 | 77,639.95 |
| **එකතුව** | **496,874.75** |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය**

## 10. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමන් විසින් අදහස් දක්වමින් පසුගිය දිනෙක රටේ සිදුවූ ම්ලේච්ඡ ත්‍රස්ත ප්‍රහාරය පිළිබඳව තම කනගාටුව පල කරන අතර, එම ප්‍රහාරයෙන් මිය ගිය සියළු දෙනාට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර රෝගාතුර වූවන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන බව පවසා සිටින ලදී. දානමය පිංකමක් සඳහා ජල බවුසරය ඉල්ලා සිටි අවස්ථාවේ එට ලබාදීමට කටයුතු කිරීම පිළිබඳව ගරු සභාපතිතුමන්ට හා ලේකම්තුමියට ස්තූතිවන්ත වන බව පවසා සිටින ලදී.

තව දුරටත් අදහස් දක්වමින් තමන් කර්මාන්ත කමිටුවේ සභාපති ලෙස තෝරා ගත්තද, පෙර සභාවක් සඳහා තමන් යෝජනාවක් ලෙස ඉදිරිපත් කර තම කොට්ඨාශයේ ප්‍රජාශාලාව ඉදිරිපිට ආරක්ෂිත බැම්ම ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඇති මුත් ඒ සම්බන්ධව දැනුවත් කිරීමක් නොකල බවත් නගර සභා ක්‍රීඩාංගණය අසළ බිම් කොටස ශුද්ධ පවිත්‍ර කිරීම සම්බන්ධයෙන් හා ඔරලෝසු කණුව පරිශ්‍රයේ සංවර්ධනයන් පිළිබඳවද ,උඩකන්ද මාර්ගයේ කොන්ක්‍රීට් ස්ලැබ් දැමීමේ කාර්යය සම්බන්ධයෙන්ද තමාව දැනුවත් කිරීමක් නොකල බව පවසා සිටින ලදී. කෙසේ වුවද තමා කර්මාන්ත කමිටුවේ සභාපතිවරයා ලෙස සුදුසු නොවේ නම්, අයින් වීමට සැම විට සූදානම් බවත් නගරයේ සංවර්ධන කාර්යයන්හිදී සහයෝගයෙන් ක්‍රියා නොකරයි නම් මෙම කටයුතු සාර්ථකව කරගෙන යා නොහැකි බවද පවසා සිටින ලදී.

මේවන විට ගම්පෙරළිය වැඩසටහන යටතේ නගරය සංවර්ධනය උදෙසා මිලියණ ගණනක ව්‍යාපෘති සිදු කර ඇති බව පැවසූ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමන් විසින් වැ කුඹුර ජලනල ව්‍යාපෘතියේ හා මාර්ග තුනක සංවර්ධන කාර්යයන් මේවන විට සාර්ථකව නිමා කර ඇති බව පවසා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන් විසින් අදහස් දක්වමින් තමන් දේශපාලන ගමන ආරම්භ කලේ මොහාන් සාලිය එල්ලාවල මැතිතුමන්ගේ සංවිධායකත්වය යටතේ බව පවසා සිටි අතර, එතුමාගේ අභාවයෙන් 10 වන අවුරුද්ද නික්ම ගිය පසු පැවති දානමය පුණ්‍යකර්මයේදි

බෞද්ධයෙක් ලෙස පින් පැමිණවීම සිදු කල බවත් නැවත එතුමන් ශ්‍රී ලංකාව තුලම ඉපදී රටට සේවයක් කිරීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන බවත් පවසා සිටින ලදී.

නගර සභා ක්‍රීඩාංගණය අසළ බිම් කොටස 2014 වර්ෂයේ ගැසට් වී අවසන් බවත්, මෙහි තිබූ පස් ඉවත් කර නගර සභාව වෙත අත්පත් කර ගත් ඉඩමේ අයිතිය තව දුරටත් තහවුරු කර ගන්නා ලෙස පවසා සිටි අතර මෙම පස්කන්ද ඉවත් කිරීම ඉතිහාසගත වන ක්‍රියාවක් බවත් දවසක් හෝ හරි කාර්යයක් සිදු කිරීම වඩා බලවත් බවත්,පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් මෙම කාර්යය සිදු කිරීම උදෙසා අනන්ත වාරයක් ස්තුතිවන්ත වන බව පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් සියළු මුස්ලිම් ව්‍යාපාරිකයන් රැස්කර පවත්වන ලද රැස්වීම සාර්ථක ක්‍රියාවක් බවත් ඒ සඳහා ස්තුතිවන්ත වන බවත් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් සදුන්ගමට ජලය ලබාදීම සම්බන්ධයෙන් ප්‍රසාදය පල කල අතර 2003 වර්ෂයේදි අයවැයෙන් මුදල් වෙන් කරගෙන බෙල්ජියම රටේ ආධාර අනුව එදා ජල ව්‍යාපෘතින් සිදු කල ආකාරය පිලිබඳව කරුණු දක්වා සිටින ලදී.

තව දුරටත් අදහස් ඉදිරිපත් කරන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් ශිෂ්‍යාධාර හා වැසිකිළි ආධාර ලබාදීම තවමත් ප්‍රමාද වීම සම්බන්ධයෙන් පළාත් සභාවෙන් කරුණු විමසා එම මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.
එමෙන්ම කර්මාන්ත ඉටුකිරීමේදි කර්මාන්තය කුමක්ද? ඒ සඳහා මුදල් ලැබෙන්නේ කොහෙන්ද? යන්න කර්මාන්ත කමිටුවේදි දැනුවත් කරන ලෙස පවසා සිටි අතර නිවැරදි කාර්යයන් සඳහා තමන් සෑම විටම සහාය දක්වන බවත්, උඩකන්ද මාර්ගයේ ස්ලැබ් දැමීම හා වැලිහරනාව මාර්ගය නියමිත ක්‍රමවේදය අනුව සිදුකර නොමැති බව තවදුරටත් පවසා සිටින ලදී.

අයි එස් අයි එස් වැනි අන්තවාදි සංවිධාන අප රට තුලින් ඉක්මනින් නැති වී රට තුළ සාමකාමී වාතාවරණයක් ගොඩනැගේවායි පවසමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් අදහස් දක්වමින් මාසික නඩත්තු වැඩසටහන යටතේ ශ්‍රී සුදර්ශනගම මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධව ස්තුතිවන්ත වීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව පවසා සිටි අතර ශිෂ්‍යාධාර හා වැසිකිළි ආධාර ලබාදීම ප්‍රමාද වීම ඇති නිසා සභාව ඒ සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු බව පවසා සිටින ලදී.

කෝපිවත්ත මාර්ගයේ සංවර්ධන කටයුතු කම්කරුවන් නැවත යථා පරිදි සංවර්ධනය කරන ආකාරය දක්නට ලැබුන බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් උඩනක්ද මාර්ගයේ ස්ලැබ් දැමීම වැනි කාර්යයන් නිසිපරිදි ඉටු නොකර තිබියදීත් එම සංවර්ධන කාර්යයන් සඳහා සභාව කඩිනමින් මුදල් ලබාදීමත්, තමන් විසින් කරන ලද සංවර්ධන කාර්යයන්හිදී ව්‍යාපෘතිය අවසන් වී මාස 3ක් යන තුරුත් මුදල් ලබාගත හැකි නොවීම සම්බන්ධව කනගාටුවට පත්වන බවත් මෙහිදී පවසා සිටින ලදී. ඉදිරියේදී මෙසේ මහජන මුදල් ලබාදීමේදී සැමට සාධාරන අයුරින් කටයුතු කරන ලෙස ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් මෙහිදී පවසා සිටි අතර,කසල ප්‍රශ්නය සම්බන්ධව ගම්වල කිසිදු කාර්යයක් සිදු කර නොමැති නිසා ඒ සම්බන්ධව විකල්පයක් හෝ ලබාදෙන ලෙසත්, හුණුකුඹුර කොට්ඨාශය තුළ සිදු කිරීමට ඉතිරිව ඇති සංවර්ධන කාර්යයන් පිළිබඳව ඉදිරියේදි ක්‍රියා කරන ලෙසද මෙහිදී ඉල්ල සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් අදහස් දක්වමින් අප්‍රේල් 21 වන දින සිදු වූ ව්‍යවසනය හේතුවෙන් මිය ගිය සියළු දෙනා වෙනුවෙන් ඔවුන්ගේ පවුලේ ඥාතීන් වෙත කනගාටුව ප්‍රකාශ කරන බවත්, අසනීප තත්වයේ පසුවන සියළු දෙනා වෙත ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන බවත් පවසා සිටින ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් එක් සභිකයෙක් සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන වශයෙන් ලක්ෂ 300,000.00 මුදලක් වෙන් කර තිබූ අවස්ථාවක තමන් විසින් උඩකන්ද මාර්ගයේ කොන්ක්‍රීට් ස්ලැබ් දැමීමේ කාර්යය ආරම්භ කල බවත් මේවන විට සභාවෙන් ලබාගෙන ඇත්තේ රු.160,000.00 මුදලක් පමණක් බවත් ඉදිරියේදි අළුතින් ස්ලැබ් යොදා ප්‍රමිතියට අනුකූලව එම කටයුතු සිදු කරන බවත් පවසා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී එම්.ශාන්තිලේඛා මැතිතුමිය</u>**

ගරු නාගරික මන්ත්‍රී එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් අදහස් දක්වමින් උඩ ඇල්ලෙපොළ පල්ලෙකුඹුර මාර්ගයේ කෙලවර කොටස කොන්ක්‍රීට් කරදෙන මෙන් ඉල්ලා සිටි අතර, කුමාරගම ප්‍රධාන මාර්ගයේ පුපුලවත්ත මහතාගේ නිවස අසළ ඇති පැති බැම්ම සකස් කිරීම සම්බන්ධවද,මහමෙව්නාව මාර්ගයේ ඇති වලවල් සකස් කිරීම සම්බන්ධවද,ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන්ගේ නිවස අසළ සිට ඉදිරියට ඇති කොටස සංවර්ධනය කර දීම සම්බන්ධයෙන්ද ගරු සභාවේ අවධානය යොමු කරන ලෙස මෙහිදී ඉල්ලා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් අදහස් දක්වමින් පාස්කු ඉරුදින දේව මෙහෙයට සහභාගී වී අන්තවාදීන්ගෙ ම්ලේච්ඡ ප්‍රහාරයෙන් මිය ගිය සියළු දෙනාගේ ඥාතීන් වෙත ශෝකය ප්‍රකාශ කරන අතර,රෝහල්ගත වී ප්‍රතිකාර ලබාගන්නා සියළු දෙනා වෙත ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන බව පවසා සිටින ලදී.

මෙම ඛේදනීය තත්වය ඇතිවීමට පෙර වළක්වාගත යුතුව තිබූ බව පැවසූ ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ආණ්ඩුවේ අත්තනෝමතික ක්‍රියාකලාපය නිසා වසර 10 භුක්ති විදි නිදහස අහිමි වී රට වැසියන් හා රට අවදානමකට ඇද දැමූ බව පවසා සිටින ලදී.එබැවින් රටේ ඉදිරි දරු පරම්පරාව ගැන සිතා කටයුතු කල යුතු බවත් සියළු දෙනා රට ආරක්ෂා කර ගැනීම උදෙසා එකා වගේ රට රැකිය යුතු බවත් පවසා සිටින ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් නගර සභා සීමාව තුළ සංවර්ධන කාර්යයන් ඉටු කිරීමේදි වරදක් වූ පසුව දොස් නැඟීමෙන් පලක් නැති බැවින් සම්බන්ධීකරණය හා අධීක්ෂනය නිසි පරිදි සිදුවිය යුතු බවත් වැලිහරනාව මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් කර ඇති අතර එය අසාර්ථක බවත්, මෙම ඇස්තමේන්තු සකස් කිරීමේසි කොට්ඨාශයේ මහජන නියෝජිතයන් සහභාගි කර ගත්තේ නම් මෙවන් තත්වයක් සිදු නොවන බවත් පවසා සිටි අතර අනදමෙත්ගම මාර්ගයේ තත්වයද එයම බැවින් කාර්මික නිළධාරීන් යොදවා මේ සම්බන්ධව අධීක්ෂනය කරන මෙන් මෙහිදී පවසා සිටින ලදී.කොට්ඨාශයේ සංවර්ධන කාර්යයන් ඉටුකිරීමේදි උඩ සිට පහළට බලය පැවරෙන ආකාරයට ක්‍රියා කල යුතු බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී

ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් මෙම කටයුතු සිදු කිරිමේදි මහජන නියෝජිතයන් දැනුවත් කල යුතු බව වැඩි දුරටත් පවසා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ඉරුදින පාස්කු මෙහෙයට සහභාගී වී ජීවිත අහිමි වූවන් වෙනුවෙන් ඔවුන්ගේ ඥාතීන්ට ශෝකය පල කරන බවත්,තුවාළ ලැබුවන් සඳහා ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන බවත් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින්, මෙම ව්‍යවසනය හේතුවෙන් රටේ සිදුවූ නොසන්සුන්කාරී තත්වය හමුවේ ආදී ශිෂ්‍ය සංගම් එකමුතුව මගින් සිදු කරන ලද වසන්ත උදානය සැලසුම් කරගත් පරිදි සිදු කිරීමට නොහැකි වුවද ඊට සහය දැක්වූ සියළුදෙනාට ස්තුතිවන්ත වන බවත් පවසා සිටින ලදී.

රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ඩබ්.ඩී.ජේ.සෙනෙවිරත්න මැතිතුමන් විසින් ලබා දුන් ප්‍රතිපාදන මගින් සුනන්දාරාම මාවතේ ජල යෝජනා ක්‍රමය සාර්ථක ලෙස සිදු කිරීමට හැකියාව ලැබුන බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින්, ඒ සඳහා මාර්ග උරහිස පළුදු කිරීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමන්ට ස්තුතිවන්ත වන බව පවසා සිටින ලදී.
තව දුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් දැනට රට තුල පවතින්නේ අළු යට ගින්දර වාතාවරණයක් බවත් කෙසේ වුවද බලංගොඩ වාතාවරණය සාමාකාමි බවත් ,අතීතයේ සිට බලංගොඩ සිංහල හා මුස්ලිම් ජනතාව සංහිදියාවෙන් ජීවිකාව ගෙන ගිය බැවින් බලංගොඩ එම සාමකාමී වාතාවරණය රැක ගැනීමට සභාවේ මුස්ලිම් මහජන නියෝජිතයන් දෙපළ වගකීමෙන් ක්‍රියා කල යුතු බවත් පවසා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමන් විසින් අදහස් දක්වමින් ගල්පොත්ත ප්‍රදේශයේ අඩිපාර පිලිබඳවද තමන් විසින් සභාවට යෝජනා ඉදිරිපත් කර ඇති බවත්,ගරු සභාපතිතුමන්ගේ මැතිවරණ පොරොන්දුවලද මෙය සඳහන් වී තිබූ බවත් පවසා සිටි අතර, තදින් වර්ෂාව ඇද හැලෙන විට වේ ගඟ ගලන බැවින් මහජනතාව මහත් පීඩා විදින හෙයින් මේ සම්බන්ධව අවධානය යොමු කරන ලෙස පවසා සිටින ලදී.

එමෙන්ම කෙත්තාරාම විහාරස්ථානය මාර්ගයේ උඩ කොටසේ පදිංචිකරුවන් වෙතින් අදාළ මහජන නියෝජිතයන් වෙත චෝදනාවක් තිබෙන බවත් එනම් වරිපනම් එකතු කලද සභාවෙන් සිදු විය යුතු සේවය ඉටුනොවන බව හා නොදිරන කසළ ඉවත්කර ගැනීමේ ගැටළුවට පිලියමක් ඉල්ලා සිටිම බව ප්‍රකාශ කල ගරු නාගරික මන්ත්‍රී කේ.පී.ජේමදාස මැතිතුමන් විසින් අක්කර 18 සමන් මහතාගේ නිවස ඉදිරිපිට කාණුවේ ජලය නිසි පරිදි ගලා නොයැම නිසා නිවසට ජලය ඇතුළු වෙන බැවින් ඒ සම්බන්ධවද සභාවේ අවධානය යොමුකරන ලෙස මෙහිදී ඉල්ලා සිටින ලදී.

තව දුරටත් අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී කේ.පී.ජේමදාස මැතිතුමන් විසින් තුඹගොඩ සුදු මල්ලි ගරාජය අසළ කාණුව වතුර රැඳී සිටීම නිසා සෞඛ්‍යයට මහත් තර්ජනයක් බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු කරන ලෙසත්, බලංගොඩ ජාතික පාසල පිටුපස බොෂිං මහතාගේ නිවස අසලට කසළ ට්‍රැක්ටරය යැවීමට ඇති හැකියාව සම්බන්ධයෙන්ද ගරු සභාවේ අවධානය යොමු කරන ලෙස මෙහිදී පවසා සිටින ලදී.

අප්‍රේල් 21 සිදු වූ ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් අදහස් දක්වා සිටි ගරු නාගරික මන්ත්‍රී කේ.පී.ජේමදාස මැතිතුමන් විසින් එය රටක් වශයෙන් දරාගැනීමට නොහැකි තරම් හානියක් සිදු වීමක් බවත්, මේ සම්බන්ධ දිගු ඉතිහාසයක් තිබෙන බවත්,එවකට පටන් මේ දක්වා සිටි රජයන් මේ සම්බන්ධව ක්‍රියාත්මක නොවීම මේ සඳහා හේතු වූ බවත් පවසා සිටින ලදී. සෑම මුස්ලිම් මිනිසෙක් දෙසම අන්තවාදියෙක් ලෙස වපර ඇසින් නොබලා ,විවෘත මනසින් විමසා බලා රටක් වශයෙන් තව දුරටත් ආර්ථික හා සමාජීය වශයෙන් ආපස්සට යාමට නොදි, අන්තවාදය පෝෂණය වීමට ඉඩ නොදී වැරදි මත සමාජයෙන් තුරන් කිරීමට වගබලා ගත යුතු බවපවසා සිටින ලදී.

**ගරු සභාපතිතුමන් විසින් මෙහිදී පිළිතුරු ලබාදෙමින්,** ගල්පොත්ත ප්‍රදේශයේ අධිපාර සම්බන්ධව පළාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඉල්ලීමක් යවා ඇති බව පවසා සිටි අතර, තුඹගොඩ සුදු මල්ලි ගරාජය අසළ කාණුව වතුර රැඳී සිටීම සම්බන්ධව කඩිනමින් සොයා බලා සුදුසු පිළියමක් යෙදීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස මහජන සෞඛ්‍ය පරීක්ෂක හා වැඩ අධිකාරී වෙත උපදෙස් ලබාදෙන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් අදහස් දක්වමින් අප්‍රේල් 21 වන දින සිදු වූ ව්‍යවසනය රටේ ආර්ථිකය කඩාවට්ටා ,රටේ ඇති වෙමින් පවතින දියුණුව නැති කිරීමේ අරමුනින් සිදු වූ කොන්ත්‍රාත්තුවක් ලෙස පවසා සිටි අතර මෙමගින් රටේ මුස්ලිම් ජනතාවට ගෞරවයෙන් ජීවත් වීමට තිබූ තත්වය නැති වී ගිය බවත් එම තත්වය නැවත උදාකර ගැනීමට බොහෝ කාලයක් ගත විය හැකි බවත් පවසා සිටින ලදී. අද වන විට ව්‍යාපාර කඩා වැටීමට ලක්ව මුස්ලිම් ජනතාව බයෙන් ජීවත් වන තත්වයක් උදා වී ඇති බවත් සිංහල ජනතාව සැම විටම මුස්ලිම් ජනතාව ආරක්ෂා කරනු ඇතැයි අපේක්ෂා කරන බවත් ,සියළු ජාතීන්ට එක්ව සතුටින් ජීවත් වීමට හැකි රටක් අනාගතයේ ගොඩනැගෙනු ඇතැයි ප්‍රාර්ථනා කරන බවත් පවසා සිටින ලදී.

**<u>ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා</u>**

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් අදහස් දක්වමින් සංවර්ධන කාර්යයන් ඉටු කිරීමේදි ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් සමග සාකච්ඡා කිරීම හා ඔවුන්ගෙන් උපදෙස් ලබාගැනීම තුළින් සාර්ථක නිමාවක් දැකගැනීමට හැකිවනු ඇති බව පවසා සිටි අතර, නගර සභාව වෙත යහපත් හා වාසිදායක කාර්යන්හිදී තමන් ඒ සම්බන්ධව නිරන්තරයෙන් සහාය දක්වා ඇති බවත් ක්‍රීඩාංගණයට යාබද බිම් කොටසේ අයිතිය නීත්‍යානුකුලව සභාව වෙත ලබාදී ඇති අතර සැම විටම ඒ සඳහා සහාය දක්වන බවත් පවසා සිටින ලදී.

බලංගොඩ වෙළෙඳ සංගමය විසින් මුස්ලිම් ප්‍රජාව සමග කරන ලද සාකච්ඡාව හා ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා හා එම පක්ෂයේ නියෝජිතයන් විසින් මුස්ලිම් ප්‍රජාව පන්සලට කැඳවා කරන ලද සාකච්ඡාව සඳහා ස්තුතිවන්ත වන බව පවසා සිටි ගරු උප සභාපතිතුමන් විසින් යම් යම් පිරිස් විසින් මුස්ලිම් ජනතාව අන්තවාදීන් ලෙස සිදු කරන ලද ප්‍රකාශ සම්බන්ධයෙන් අතිශයින් කනගාටුවට පත්වන බවත්, සියළුම මුස්ලිම්වරු ත්‍රස්තවාදීන් නොවන බවත්, සමාජ මාධ්‍යයන් හරහාද මුස්ලීම් ජනතාව දෙස වෛරීව බලමින් නිකුත් කරන ලද ප්‍රකාශ නිසා මහත් අපහසුතාවයට පත්වන බවත් පවසා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා</u>**

ගරු නාගරික වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් අදහස් දක්වමින් ක්‍රීඩාංගණයට යාබද ඉඩම සම්බන්ධ කටයුත්ත සඳහා දූනුම් දීමක් සිදු කලානම් පක්ෂ භේදයෙන් තොරව සහයෝගය ලබාදෙන බව පවසා සිටි අතර, රටේ පවතින අනතුරුදායක තත්වය හමුවේ සිංහල ජනතාවට ඉස්ලාම් ධර්මය පිළිබඳ බියක් පවතින බවත්, එංගලන්තයේ හතර වරක් රජ වූ විලියම් කුමාරයා විසින් පවසා ඇති පරිදි " කුරානය තියෙන කල් සාමය නැතිවේවි " යන ප්‍රකාශය පිළිබඳව නැවත වරක් සිතීමේ අවස්ථාව උදා වී ඇති බවත් පවසා සිටින ලදී.

වර්තමානයේ ගඟක බැස නෑමට තරම් බිය විය යුතු තත්වයක් මහජනතාව තුලින් පැනනැගී ඇත්තේ රට තුළ විශාල කඩු ප්‍රමාණයක් සොයා ගැනීම නිසා බව පවසා සිටි ගරු නාගරික වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් රටේ ඇති වී තිබෙන තත්වය ශෝචනීය බව ප්‍රකාශ කරන ලදී. ආගමකට මිනිස්සු අවශ්‍ය නැති බවත්,මිනිසුන්ට ඇදහීම සඳහා ආගමක් අවශ්‍ය වන බවත් පවසා සිටි ගරු නාගරික වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් සිංහල ජනතාවට රටේ සෑම තැනකම ගමන් කිරීමේ හැකියාව අහිමි වී ඇති බවත්, රාජ්‍ය පාලකයන් පිලිබඳව රට වැසියන්ට විශ්වාසයක් නැති බවත් එදා සිට අද දක්වා සිටි පාලකයනගේ දේශපාලන අරමුනු නිසා රටට මෙවන් තත්වයක් උදා වී ඇති බවත් ඉදිරියේදි හෝ රට ගැන සිතන නායකත්වයක් රටේ ඇති වේවායි අපේක්ෂා කරන බවත් ජාතික එකමුතුව අවශ්‍ය බවත් පවසා සිටින ලදී.

**11. අවසානය**

ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් රට තුළ නිසියාකාර ජාතික ප්‍රතිපත්ති නොමැතිව මැතිවරණ කාලවලදී පත්වන දේශපාලන නායකයින්ගේ හැසිරීම නිසා රටේ මෙවන් තත්වයක් ගොඩ නැගී ඇති බව පැවසූ ගරු සභාපතිතුමන් විසින් සභාව නියෝජනය කරනු ලබන මුස්ලිම් මන්ත්‍රිවරුන් දෙපළ අනෙක් මන්ත්‍රිවරුන් විසින් පවසන ලද කරුණු නිසි අයුරින් ග්‍රහණය කොට ගෙන ඉදිරි වැඩ කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටින ලදී.රටට පොදු රාජ්‍ය ප්‍රතිපත්තියක් අවශ්‍ය බවත් රට වැසියන් සියළු දෙනා එක නීතියක් යටතේ අනුගත විම අවශ්‍ය බවත් පවසා සිටින ලදී.

නගර සභා ක්‍රීඩාංගණයට යාබද බිම් කොටස සභාවට අත්පත් කර ගැනීම සම්බන්ධව කරුණු දක්වා සිටි ගරු සභාපතිතුමන් විසින් එම තීරණය රහසිගතව හා ක්ෂණිකව ක්‍රියාත්මක කල කාර්යයක් බැවින් ආරක්ෂාකාරී පියවරක් ලෙස කිසිවෙක් දූනුවත් නොකල බවත් ඒ සම්බන්ධ හිත් රිදීමක් සිදු

වූයේ නම් කනගාටුවට පත්වන අතර නගරයට පොදු සම්පතක් වූ මෙම ඉඩම සභාවට අත්කර ගැනීම සම්බන්ධව මහත් සේ සතුටට පත්වන බවත් පවසා සිටින ලදී. සභාපතිවරයෙක් ලෙස තමන්ට ක්ෂණික තීරණ ගැනීමට සිදු වෙන බවත් ඔරලෝසු කණුව අසල පරිශ්‍රයේ සංවර්ධන කටයුතු පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය සම්බන්ධ ගැටළුවක් නිසා එම ආයතනය පොළඹවා ගැනීමේ අරමුනින් ක්ෂනිකව ගන්නා ලද තීරණයක් බවත් ,බෝම්බුව ප්‍රජා ශාලාව ඉදිරිපිට පැති බැම්ම සකස් කිරීම මුදල් කමිටුවේදී ගන්නා ලද තීරණයක් බැවින් මෙවැනි කටයුතු සම්බන්ධව අනවබෝධ තබා නොගන්නා ලෙස පවසා සිටි ගරු සභාපතිතුමන් විසින් කසළ ගැටළු සඳහා පිළියමක් වශයෙන් ඉදිරියේදි කොට්ඨාශ මට්ටමින් කසළ කමිටු පිහිටුවීම මගින් මේ සඳහා පිළියම් ලැබෙන බව පවසා සිටින ලදී.

රටේ පවතින නොසන්සුන්කාරී තත්වය හමුවේ නගරයේ ආරක්ෂාව සඳහා ආරක්ෂක අංශවල උපරිම සහයෝගය ලබාගනිමින් ක්‍රියා කිරීමට අපේක්ෂා කරන බව පවසා සිටි ගරු සභාපතිතුමන් විසින් නගරයේ සියළු ජනතාවගේ සුරක්ෂිතතාවය වෙනුවෙන් තමන් සෑම විටම කැපවී සිටින බව ප්‍රකාශ කරමින් අද දින සභාවට සම්බන්ධ වූ සියළු දෙනාට ස්තුතිවන්ත වෙමින් සභාවේ වැඩ කටයුතු ප.ව.4.00 ට පමණ අවසන් කරන ලදී.

චමික ජයමිණි විමළසේන,
සභාපති,
බලංගොඩ නගර සභාව.